වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT 2023

ඉඩම් මැනුම් සභාව

நில அளவைகள் சபை

Land Survey Council

ඉඩම් මැනුම් සභාව, සර්වේයර් ජනරාල් කාර්යාලය,අංක150, කොළඹ 05

நில அளவைகள் சபை, நில அளவையாளர் நாயக அலுவலகம்,இல. 150, கொழும்பு 05

Land Survey Council, Surveyor General's Office, No 150, Colombo 05

පටුන

1.	සභාපතිතුමාගේ පණිවුඩය	02
2.	දැක්ම සහ මෙහෙවර	03
3.	ඉඩම් මැනුම් සභාව	04
4.	ඉඩම් මැනුම් සභාවේ කාර්යයන්	05
5.	ඉඩම් මැනුම් සභාව සතු බලතල	06
6.	ඉඩම් මැනුම් සභාවේ කාර්යය සාධන වාර්තාව	07
7.	ඉඩම් මැනුම් සභාවේ කාර්යය මණ්ඩලය	08
8.	ඉඩම් මැනුම් සභාවේ ක්‍රියාකාරකම්	08
9.	අධ්‍යයන හා පුහුණු වැඩ කටයුතු	14
10.	මූල්‍ය කළමනාකරණය	16
11.	2023 වර්ෂය සඳහා අවසාන ගිණුම් ප්‍රකාශනය	
	I. මූල්‍ය තත්ව ප්‍රකාශනය	
	II. මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය	
	III. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය	
	IV. හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය	
	V. 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්වය පිළිබඳ සටහන	
	VI. 2023 දෙසැම්බර් 31 දිනට පොදු ගිණුම් ප්‍රතිපත්ති	
12	විගණකාධිපති වාර්තාව 2023	

01. සභාපතිතුමාගේ පණිවුඩය

ඉඩම් මැනුම් සභාව,
සර්වේයර් ජනරාල් කාර්යාලය,
අංක150, බර්නාඩ් සොයිසා මාවත,
කොළඹ 05.
2024.02.20

ඉඩම් මැනුම් සභාව ජාතික ලියාපදිංචි කිරීමේ ආයතනයක් ලෙස 2002 අංක 17 දරණ මැනුම් පනත මගින් ස්ථාපනය කරන ලද අතර මෙය ශ්‍රී ලංකා වෛද්‍ය සභාව හැරුණු කොට එසේ දෙවන වරට ස්ථාපිත ආයතනයයි. මෙහිදී ප්‍රධාන වශයෙන් වෘත්තිය මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය පිළිගැනීම ලබාදීම සඳහා ඔවුන් ලියාපදිංචි කිරීම, එසේ ලියාපදිංචි වන මිනින්දෝරුවරුන් සඳහා සුදුසුකම් පරීක්ෂා කර වාර්ෂික මැනුම් බලපත්‍ර නිකුත් කිරීම, අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කොට මැනුම් ක්ෂේත්‍රයේ ලොව හඳුන්වා දෙන සහ පවතින නවීන සංකල්පයන් සමඟින් එකී වෘත්තිකයකින් ඉදිරියට ගෙනයාම ප්‍රධාන කොට වේ. 2022 වසරේ රටේ තිබූ අර්බුදකාරී තත්ත්වයන් 2023 වන විට සමනය ක්‍රමයෙන් සමනය වෙමින් තිබීම මගින් ඉඩම් මැනුම් සභාව නව පියවරයන් සමගින් ඉදිරියට යාමට සැලසුම් කිරීමට හැකිවී ඇත.

ශ්‍රී ලංකා සබරගමුව විශ්ව විද්‍යාලය සහ කොතලාවල ආරක්ෂණ විශ්ව විද්‍යාලය වැනි ආයතනවලින් බිහිවන මැනුම් විද්‍යා උපාධිධාරීන් මේ වනවිට සැලකිය යුතු ප්‍රමාණයක් සිටින බැවින් ඔවුන් සඳහා වෘත්තීය පිළිගැනීමක් ලබාදීම වෙනුවෙන් ඉඩම් මැනුම් සභාව 2023 වර්ෂය තුළදී නව රෙගුලාසි සකස් කිරීමට හැකිවීම යහපත් කාරණයකි. මීට පෙර ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය ලබාගනු ලැබුවේ, ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ සේවයට බඳවාගැනීමෙන් එක්වන මිනින්දෝරු වෘත්තිකයන් ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීම ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවම තුළින් සිදුවුවද පසුකාලීනව රජයේ සේවයට බඳවා ගැනීම් සීමා වීම වැනි කරුණු හේතුවෙන් ඉහත කී විශ්ව විද්‍යාලවලින් පිටවන උපාධිධාරීන් හට වෘත්තිය පිළිගැනීම සඳහා ලියාපදිංචිය ලබාගැනීම ගැටළුසහගත තත්වයකට පත්විය.

මැනුම් පනතේ අදාල වගන්ති ප්‍රකාරව නව රෙගුලාසි හඳින්වාදීම තුළින් එම ප්‍රායෝගික පුහුණුව ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව හැරුණු කොට මිනින්දෝරු ක්ෂේත්‍රයේ වඩා නිපුණත්වයක් ඇති ලියාපදිංචි බලයලත් මින්දෝරුවරුන් යටතේ එකී ප්‍රායෝගික පුහුණුව ලබා ගැනීමට අවකාශ සැලසීම මෙම නව රෙගුලාසි පිළියෙල කිරීම මගින් බලාපොරොත්තු වේ. එසේම ඒ ආකාරයට ලියාපදිංචිය ලබා ගන්නා මිනින්දෝරුවරුන් හට පුද්ගලික සේවයේ යෙදීමට වාර්ෂික මැනුම් බලපත්‍රය ලබා දීමටද නව රෙගුලාසි ඒ සමගම පිළියෙල කර ඇත. එම රෙගුලාසි මේ වනවිට දෙවන වරට නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුවේ පරීක්ෂාවට ලක්වෙමින් පවතින අතර කඩිනමින් එය ගැසට් පත්‍රයේ පලකිරීමට හැකිවෙතැයි අපේක්ෂා කෙරේ.

එසේම මැනුම් සභාවේ තවත් විශේෂිත වූ කාර්යයක් ලෙස ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ වෘත්තීයමය විනය පාලනය වෙනුවෙන් ද වගකීම් දරන අතර ලියාපදිංචි මිනින්දෝරුවරුන්ට එරෙහිව මහජනයා ඉදිරිපත් කරන පැමිණිලි විභාග කිරීමත්, එම විභාග කිරීම් මගින් මැනුම් ගැටළු සම්බන්ධයෙන් මහජනතාව වෙත සහනයන් ලබාදීමටද 2023 වසරේදී ද හැකිව ඇත. මෙම පැමිණිලි විභාග කිරීම වේගවත් කිරීම සම්බන්ධයෙන් අවධානය යොමුකර ඇති අතර 2020 වසරේ ඇතිවූ කොවිඩ් තත්වය හේතුවෙන් විසඳීමට නියමිතව ඇති පැමිණිළි සංඛ්‍යාව මදක් ඉහල ගොස් ඇත.

තවද ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ තොරතුරු, විශේෂයෙන් අතීත මිනින්දෝරුවරුන්ගේ තොරතුරු මහජනයා වෙත ලබා දීමත් සිදුකිරීමට හැකිවූ අතර රජයෙන් කිසිදු අරමුදලක් ලබානොගෙන මෙකී මහජන සේවාවන් ඉටුකිරීමට හැකිවීමද විශේෂිත තත්වයකි. පනතේ විධිවිධාන ප්‍රකාරව වෙනත් දේශීය මෙන්ම විදේශීය වෘත්තීයමය ආයතන සමග සමායෝජනය කිරීමත් ඉඩම් මැනුම් සභාවේ වගකීම් වලට අයත් වන අතර ඉදිරි වසරවලදී එකී පියවරයන් වෙතද ලගාවීමට අපේක්ෂා කෙරේ.

සමාලෝචිත කාලසීමාව තුල ඉඩම් මැනුම් සභාව හොඳින් පවත්වා ගෙන යාම සඳහා වැඩ බලන ලේකම්, ගණකාධිකාරී (අර්ධ කාලීන) ඇතුළු සමස්ත කාර්යය මණ්ඩල මෙන්ම ඉඩම් මැනුම් සභාවේ සියළු සාමාජිකයන්ගෙන් ලැබුණු සහයෝගය සහ කැපවීම පිළිබඳ මාගේ ස්තුතිය පුද කරමි.

ඩබ්ලිව්. සුදත් එල්.සී.පෙරේරා
සභාපති

02. දැක්ම සහ මෙහෙවර

දැක්ම

ඉඩම් මැනුම් සඳහා ක්‍රමවත් රාමුවක අඛණ්ඩතාව පවත්වා ගනිමින් ජාතික සංවර්ධනය උදෙසා අපගේ භෞතික හා ස්වභාවික සම්පත්වල ප්‍රශස්ත හා තිරසාර උපයෝගිතාව තහවුරු කර, ඒ තුළින් තරහකාරී ගෝලීය වෙළඳපොළ තුළ ගුණාත්මක මෙන්ම වෘත්තිය නිපුණත්වයෙන් යුත් මැනුම් සේවාවන් වෙත නාභිගත වී වෘත්තියමය පරිසරය ශක්තිමත් කිරීම අපගේ මැනුම් සභාවේ දැක්ම වේ.

මෙහෙවර

මැනුම් වෘත්තිය හා එහි ව්‍යවහාරයන් ක්‍රමවත්ව පවත්වා ගන්නා බවටත්, වෘත්තියෙන් බලාපොරොත්තු වන්නාවූ නාක්ෂණික නියමයන් සහ සදාචාරමය ප්‍රමිතීන් වලට එකඟ වන ලෙස පුහුණුවක් හා අධ්‍යාපනයක් වෘත්තීයට ප්‍රවේශ වන්නන් වෙත ලැබෙන බවටත්, එම නිසා වෘත්තියේ යෙදෙන්නන් විසින් වෘත්තිය පැවැත්මේ ඉහළම ප්‍රමිතීන් පවත්වාගනු ලබන බව තහවුරු කිරීම ඉඩම් මැනුම් සභාවේ මෙහෙවර වේ.

03. ඉඩම් මැනුම් සභාව

2002 අංක 17 දරන මැනුම් පනතෙහි 26 වැනි වගන්තියේ සඳහන් විධි විධාන අනුව කොළඹ 05, කිරුළ පාර, අංක 150 ස්ථානයේ පිහිටි සර්වේයර් ජනරාල් කාර්යාල ගොඩනැගිල්ලේ බිම් මහල තුළ, 2003 වර්ෂයෙහි මාර්තු මාසයේ දී ඉඩම් මැනුම් සභාව ස්ථාපිත කරන ලදී.
මැනුම් පනතේ 27 වැනි වගන්තිය යටතේ ඉඩම් මැනුම් සභාවේ සංයුතිය කෙසේ විය යුතු ද යන්න පිළිබඳව විධි විධාන සලස්වා ඇත. එකී විධිවිධාන වලට අනුව ඉඩම් මැනුම් සභාව සාමාජිකයින් 7 දෙනෙකුගෙන් සමන්විත වන අතර එම සාමාජිකයින් පත්වන ආකාරය පහත සඳහන් පරිදි විස්තර කෙරේ.

(අ) නිලබලයෙන් පත්වන සාමාජිකයින්

i. සභාපති - සර්වේයර් ජනරාල් වරයා

ii. උප සභපති - සර්වේයර් ජනරාල් විසින් නම් කරනු ලබන නියෝජ්‍ය සර්වේයර් ජනරාල්ට අඩු නොවන ධූරයක් දරන ලියාපදිංචි මිනින්දෝරු වරයෙකු

iii. සාමාජික - 1969 අංක 21 මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතන පනත මගින් පිහිටුවා ඇති මැනුම් හා සිතියම් ගත කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂකවරයා

(ආ) පත්වන සාමාජිකයින්

i. සාමාජික - 1982 අංක 22 දරණ ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය (සංස්ථාගත කිරීමේ) පනත මගින් සංස්ථාගත කරන ලද ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය විසින් නම් කරනු ලබන ඉඩම් මැනීම පිළිබඳ පුළුල් අත්දැකීම් හා ප්‍රත්‍යක්ෂ සාමාර්ථයන් දරණ මිනින්දෝරුවරුන් තිදෙනෙක්

ii. සාමාජික - 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතින් පිහිටවූ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාලයකින් නම් කරණු ලබන අධ්‍යාපන, පරිපාලන, කළමනාකරණ හෝ ඉංජිනේරු විද්‍යාව යන ක්ෂේත්‍රයන් හි එක් විද්වතෙකු

මෙම පත්කිරීම් අමාත්‍යවරයා විසින් සිදුකරනු ලැබේ.

04. ඉඩම් මැනුම් සභාවේ කාර්යයන්

ඉහත පනතේ 37 වගන්තියට අනුව ඉඩම් මැනුම් සභාවේ කාර්යයන් පහත පරිදි වේ.

(අ) ඉඩම් මැනීමට අදාළ ප්‍රමිති හා කාර්යය පටිපාටිය පවත්වාගෙන යාම හා ඉඩම් මැනීමේ කටයුතුවල යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තීමය විනය පවත්වාගෙන යාම.

(ආ) ලියාපදිංචි මිනින්දෝරුවරු ලෙස ලියාපදිංචි කිරීම සඳහා මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර භාරගැනීම සහ ඒ මිනින්දෝරුවරුන්ට ඉඩම් මැනීමේ කටයුතු කරගෙන යාම සඳහා නියමිත සුදුසුකම් සහ පළපුරුද්ද සහ හැකියාව සහ නිපුණතාවය ඇති බවට සභාව සෑහීමකට පත්වන අවස්ථාවන්හි ඔවුන් ලියාපදිංචි කිරීම.

(ඇ) වෘත්තියේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත්‍ර භාර ගැනීම සහ ඉඩම් මැනීමේ වෘත්තියෙහි යෙදීමට එම මිනින්දෝරුවරුන්ට දැනුම හා දක්ෂතාවය ඇති බවට සභාව සෑහීමට පත්වන අවස්ථාවන්හි දී ඔවුන්ට එම බලපත්‍ර නිකුත් කිරීම.

(ඈ) ඉඩම් මැනීමේ යෙදී සිටින තැනැත්තන් අතර වෘත්තීයමය අධ්‍යාපනය පිළිබඳ උසස් ප්‍රමිතීන් පවත්වාගෙන යාම ප්‍රවර්ධනය කිරීම.

(ඉ) මිනින්දෝරු වෘත්තියේ යෙදී සිටින සහ වාර්ෂික වෘත්තීය බලපත්‍ර ලබා ගැනීමට නියම කරන ලද තැනැත්තන්ගේ දැනුම හා දක්ෂතා වැඩිදියුණු කිරීමේ කාර්යය සඳහා වෘත්තීමය සංවර්ධන වැඩ සටහන් ප්‍රවර්ධනය කිරීම.

(ඊ) ඉඩම් මැනීම පිළිබඳ ශාස්ත්‍රීය හා වෘත්තීමය සුදුසුකම් පිළිගැනීම, ප්‍රායෝගික පළපුරුද්ද පිළිබඳ අවශ්‍යතා නියම කිරීම සහ ලියාපදිංචි මිනින්දෝරුවන් ලෙස ලියාපදිංචි වීමට සහ වාර්ෂික වෘත්තිමය බලපත්‍ර නිකුත් කිරීම සඳහා වූ අපේක්ෂකයන් වෙනුවෙන් සුදුසුකම් ලැබීමේ විභාග හා වෘත්තීමය සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.

(උ) ඉඩම් මැනීමේ යෙදී සිටින තැනැත්තන්ගේ අධ්‍යාපනය, පුහුණුව හා පිළිගැනීම යන කරුණු වලදී සම තත්වයක් සහ අන්‍යොන්‍යතාවයක් ස්ථාපිත කිරීම සඳහා විදේශීය රටවල බලධරයන් සමඟ අන්‍යෝන්‍ය වැඩ පිළිවෙළවල් සඳහා එකඟතාවය ඇතිකර ගැනීම හා ක්‍රියාත්මක කිරීම.

(ඌ) නියම කරන ලද අධ්‍යාපන ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා ශ්‍රී ලංකාවේ ඉඩම් මැනුම් කටයුතු හා ඉඩම් නොරතුරු අධ්‍යාපන හා පුහුණු කටයුතු පිළිබඳව නියැලී සිටින ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

(එ) ශ්‍රී ලංකාවේ වෙනත් අදාළ වෘත්තිමය ආයතන හා සම්බන්ධ වෙමින් උසස් වෘත්තීය ප්‍රමිතීන් පවත්වාගෙන යාම

05. ඉඩම් මැනුම් සභාව සතු බලතල

5.1 මැනුම් පනතේ 38 වගන්තියට අනුව ඉඩම් මැනුම් සභාව සතු බලතල පහත පරිදි වේ.

(අ) යම් වංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම, දැරීම, බද්දට ගැනීම හෝ බද්දට දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම.

(ආ) මුදලින් හෝ අන්‍යාකාරයේ වූ ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග භාරගැනීමට සහ ස්වකීය කර්තව්‍යය ඉටු කිරීම සඳහා ඒවා යොදා ගැනීම.

(ඇ) සභාවේ කටයුතු කරගෙන යෑම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් පත් කිරීම.

(ඈ) එසේ පත්කරන ලද නිලධරයන්ට සහ සේවකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික තීරණය කිරීම.

(ඉ) ස්වකීය කර්තව්‍යයන් ඵලදායි ලෙස ඉටුකිරීම සඳහා කමිටු පත් කිරීම.

(ඊ) ස්වකීය නිලධරයන් හා සේවකයන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් පිහිටුවීම සහ සුභ සාධන හා ක්‍රීඩා පහසුකම් සැපයීම.

(උ) සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සෑදීම සහ

(ඌ) සාමාන්‍යයෙන් සභාවේ කර්තව්‍යය නිසි පරිදි ඉටු කිරීම පහසු කරලීම සඳහා අවශ්‍යවන අනෙකුත් සියලු දේ කිරීම.

5.2 මැනුම් පනතේ 47 වගන්තියට අනුව ඉඩම් මැනුම් සභාව සතු විනය බලතල පහත පරිදි වේ.

(1) මේ කොටසට අනුකූලව පරීක්ෂණයක් පැවැත්වීමෙන් පසු ලියාපදිංචි මිනින්දෝරුවරයෙකු වෘත්තීය විෂමාචාරයට වරදකරු වී ඇති බවට සභාව සෑහීමට පත්වන අවස්ථාවකදී සභාව විසින් පහත සඳහන් නියමයන්ගෙන් එකක් හෝ ඊට වැඩි ගණනක් කරනු ලැබිය හැකිය :-

(අ) ලියාපදිංචි මිනින්දෝරුවරයාගේ ලියාපදිංචිය අවලංගු කොට ඒ මිනින්දෝරුවරයාගේ නම, නාම ලේඛනයෙන් ඉවත් කරන ලෙස වූ නියමයක් කිරීම :

(ආ) ලියාපදිංචි මිනින්දෝරුවරයාගේ ලියාපදිංචිය අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා අත්හිටුවන ලෙස වූ නියමයක් කිරීම :

(ඇ) ලියාපදිංචි මිනින්දෝරුවරයකුට නිකුත් කරන ලද වෘත්තියෙහි යෙදීමේ වාර්ෂික බලපත්‍රයක් අත්හිටුවන ලෙසට වූ නියමයක් කිරීම :

(ඉ) සභාව විසින් පනවනු ලැබිය හැකි කොන්දේසිවලට යටත්ව අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා ඉඩම් මැනීමේ වෘත්තියේ යෙදීමට ලියාපදිංචි මිනින්දෝරුවරයාට හැකි බවට වූ නියමයක් කිරීම :

(ඊ) ගාස්තු පිළිබඳව හෝ සභාව විසින් උචිත යයි සලකනු ලබන අන්‍යාකාර වූ, වෙනත් යම් උචිත නියමයක් කිරීම.

(2) මේ වගන්තිය යටතේ වූ ලියාපදිංචිය අත්හිටුවීමේ නියමයක් බලාත්මකව පවතින විට ඒ තැනැත්තා මේ පනතේ කාර්ය සඳහා ලියාපදිංචි නොවූ තැනැත්තකු ලෙස සලකනු ලැබිය යුතු ය. නමුත් ඒ නියමය අවසන් වූ වහාම එසේ අවසන්වීමේ දින සිට ලියාපදිංචි මිනින්දෝරුවරයකු ලෙස ඔහුගේ අයිතිවාසිකම් සහ වරප්‍රසාද නැවත ලබාදිය යුතුය.

(3) මේ වගන්තිය යටතේ ගෙවිය යුතු සියලු ගාස්තු සහ වියදම් සභාවට අයවිය යුතු ණයක් වශයෙන් සභාව විසින් අයකරගනු ලැබිය යුතු ය.

06. 2023 වර්ෂය සඳහා ඉඩම් මැනුම් සභාවේ කාර්යය සාධන වාර්තා

6.1 2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා වූ සමාලෝචිත කාලසීමාව තුළ සභාවේ සංයුතිය සහ එම සාමාජිකයින්ගේ පත්වීම් දින පහත පරිදි වේ .

අනු අංකය	නම	තනතුර	කාලසීමාව
1	එස්.සිවානන්දරාජා මහතා	සභාපති	2023.01.01සිට 2023.08.30 දක්වා
2	ඩබ්.එස්.එල්.සී. පෙරේරා මහතා	සභාපති	2023.08.30 සිට 2023.12.31 දක්වා
3	ඩබ්.එස්.එල්.සී. පෙරේරා මහතා	උප සභාපති	2023.01.01 සිට 2023.08.30 දක්වා
4	ආර්.එම්.එස්.බී.රත්නායක මහතා	උප සභාපති	2023.08.30 සිට 2023.12.23 දක්වා
5	යූ.එම්.ඒ.බී.අලහකෝන් මහතා	උප සභාපති	2023.12.23 සිට 2023.12.31 දක්වා
6	මහාචාර්යකේ.එම්.සී.කොන්තසිංහමහතා	සාමාජික	2023.01.01 සිට 2023.12.31 දක්වා
7	සී..ඩී.පී.ආර්.බස්නායක මහතා	සාමාජික	2023.01.01 සිට 2023.02.23 දක්වා
8	යූ.කේ.එස්.පී.විජේසිංහ මහතා	සාමාජික	2023.02.23 සිට 2023.12.23 දක්වා
9	එන්. ඒ. ගුණවර්ධන මහතා	සාමාජික	2023.01.01 සිට 2023.12.31 දක්වා
10	කේ.ඒ.කේ.එල්. එදිරිසිංහ මහතා	සාමාජික	2023.01.01 සිට 2023.12.31 දක්වා
11	ජේ.එම්. විජේවර්ධන මහතා	සාමාජික	2023.01.01 සිට 2023.12.31 දක්වා

<u>සටහන:</u> මැනුම් පනත ප්‍රකාරව සභාවේ ඉහත සංයුතියට අමතරව මුදල් අමාත්‍යාංශය නියෝජනය කරමින් නියෝජිතයෙකු සභාවේ මාසික පාලක මණ්ඩල රැස්වීම් සඳහා සහභාගි වේ.
2023.01.01 දින සිට 2023.12.31 දින දක්වා වූ සමාලෝචිත කාලසීමාව සඳහා, මුදල් අමාත්‍යාංශ නියෝජිතයන් ලෙස, සහභාගී වීම පහත පරිදි වේ.

අනු අංකය	නම	කාල සීමාව
1	එච්.එම්. සාලිය ධර්මවර්ධන මහතා	2023.01.01. සිට 2023.02. 17 දක්වා
2	ඩී.කේ.විජේසිංහ මිය	2023.02.17 සිට 2023.05.26 දක්වා
3	ඩී.සී.ජයදේව මිය	2023.05.26 සිට 2023.12.31 දක්වා

6.2 2023.01.01 දින සිට 2023.12.31 දක්වා වූ සමාලෝචිත කාල සීමාව තුල මාසික සභා රැස්වීම් 09 ක්, මහජන පැමිණිලි විමර්ශනය සඳහා රැස්වීම් 07 ක් හා උප කමිටු රැස්වීම් 07 ක් පවත්වා ඇත.

එම රැස්වීම් සඳහා එක් එක් සමාජිකයින්ගේ සහභාගිවීම් පහත පරිදි වේ.

අනු අංකය	නම	තනතුර	මාසික රැස්වීම්	විමර්ශණ රැස්වීම්	උප කමිටු රැස්වීම්
1	එස්.සිවානන්දරාජා මහතා	සභාපති	8	6	4
2	ඩබ්.එස්.එල්.සී. පෙරේරා මහතා	සභාපති	3	7	1
3	ඩබ්.එස්.එල්.සී. පෙරේරා මහතා	උප සභාපති	8	3	6
4	ආර්.එම්.එස්.බී.රත්නායක මහතා	උප සභාපති	3	3	1
5	මහාචාර්යකේ.එම්.සී.කොන්තසිංහමහතා	සාමාජික	5	-	1
6	සී..ඩී.පී.ආර්.බස්නායක මහතා	සාමාජික	2	-	2
7	යූ.කේ.එස්.පී.විජේසිංහ මහතා	සාමාජික	8	11	4
8	එන්. ඒ. ගුණවර්ධන මහතා	සාමාජික	11	12	14
9	කේ.ඒ.කේ.එල්. එදිරිසිංහ මහතා	සාමාජික	11	12	14
10	ජේ.එම්. විජේවර්ධන මහතා	සාමාජික	11	11	14

07. ඉඩම් මැනුම් සභාවේ කාර්යය මණ්ඩලය

මැනුම් පනතේ 55 වැනි වගන්තිය මගින් සභාවේ කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අවශ්‍යයැයි සභාව සලකනු ලබන නිලධාරීන් හා සේවකයන් පත්කර ගැනීමට මැනුම් සභාවට බලය පැවරී ඇත. ඒ අනුව 2023.01.01 දින සිට 2023.12.31 දක්වා වූ සමාලෝචිත කාලසීමාව සඳහා මැනුම් සභාවේ කාර්ය මණ්ඩලය පහත සඳහන් පරිදි වේ.

අනු අංකය	නම	තනතුර	පත්වීම් දිනය
1	එම්.එන්.අමරසිරි මයා	ලේකම් / වැඩ බලන	2021.12.01
2	පී.ඩී.අනුරසිරි මයා	ලේකම් / වැඩ බලන	2023.03.01
2	කේ.එල්.ඒ.එන්.සඳමාලි මිය	ගණකාධිකාරී / අර්ධ කාලීන	2021.10.05
3	ඩබ්ලිව්.ඒ.එස්.ප්‍රියදර්ශනි මිය	පරිගණක වැඩසටහන් සහකාර /ලිපිකරු	2004.05.24
4	එච්. කේ. කුලතුංග මිය	පරිගණක වැඩසටහන් සහකාර /ලිපිකරු (කොන්ත්‍රාත් පදනම)	2023.07.18
5	ඒ.එච්. දහනායක මිය	පරිගණක වැඩසටහන් සහකාර /ලිපිකරු (කොන්ත්‍රාත් පදනම)	2023.11.10
6	එම් .ඩී.එච් .හන්සනී මිය	පරිගණක වැඩසටහන් සහකාර /ලිපිකරු (කොන්ත්‍රාත් පදනම)	2023.12.08
7	ටී.ජී.ප්‍රනාන්දු මයා	කාර්යාල කාර්යය සහයක	2004.07.15

08. ක්‍රියාකාරකම්

8.1. ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචි කිරීම සහ වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් නව රෙගුලාසි සකස් කිරීම.

මැනුම් විද්‍යාව පිළිබඳ උපාධිය හෝ පශ්චාත් උපාධිය සහිත මිනින්දෝරු වෘත්තිකයන් හට ඔවුන්ගේ වෘත්තීය පිළිගැනීම ලබාදීම සඳහා ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය ලබා දීමට මෙතෙක් භාවිතා වූ වැඩපිළිවෙල වූයේ පවතින පුරප්පාඩු අනුව ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට බඳවා ගැනීමෙන් පසු ප්‍රායෝගික පුහුණුව ලබාගැනීමෙන් ලියාපදිංචිය ලබාදීම වේ. එහෙත් මේ වනවිට විශ්ව විද්‍යාලවලින් පිටවන මැනුම් විද්‍යා උපාධිය හෝ පශ්චාත් උපාධිය සහිත වෘත්තිකයන් සියලු දෙනා දෙපාර්තමේන්තුවට බඳවා නොගන්නා බැවින් සැලකිය යුතු පිරිසකට ලියාපදිංචිය ලබාගැනීම ගැටළු සහගත වී තිබුණි. එවැනි වෘත්තිකයින් සඳහා ලියාපදිංචිය ලබාදීම වෙනුවෙන්, පනතේ විධිවිධාන වලට ප්‍රකාරව නව රෙගුලාසි සකස් කොට 2023 වර්ෂයේදී නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යවන ලද අතර සංස්කරණයන් සිදුකොට නැවත නිරීක්ෂණයන් සඳහා ඉඩම් මැනුම් සභාව වෙත ඒවා ඇත. ඒ අනුව 2024 වර්ෂයේ මුල් කාර්තුව වන විට මෙම නව රෙගුලාසි ගැසට් කිරීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම එවැනි ලියාපදිංචි මිනින්දෝරුවරයෙකු හට පුද්ගලික සේවයේ යෙදීමට නිකුත් කරනු ලබන වාර්ෂික මැනුම් බලපත්‍රය ලබාදීම සඳහා ලියාපදිංචිය මෙන්ම සමාන්තර රෙගුලාසි සකස් කොට ඉහත අදියරේම පවතී.

8.2 ලියාපදිංචි කිරීම


2023.01.01 දින සිට 2023.12.31 දක්වා වූ සමාලෝචිත කාල සීමාව සඳහා, මැනුම් පනතෙහි 39 වැනි වගන්තිය සමඟ කියවිය යුතු උපලේඛනය අනුව ශාස්ත්‍රීය සුදුසුකම් හා නියමිත ප්‍රායෝගික පළපුරුද්ද සපුරන ලද අයදුම්කරුවන් 24 දෙනෙකු (2023 වර්ෂයෙන් ඉදිරියට ගෙනෙන ලද අයදුම්පත් 11 ක් ද සමඟ) ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය සඳහා ඉල්ලුම්පත් යොමු කරන ලදි.

එලෙස ලියාපදිංචි මිනින්දෝරුවරු ලෙස ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචි වීම සඳහා ඉල්ලුම් කිරීමට අවශ්‍ය ශාස්ත්‍රීය සුදුසුකම් හා, නියමිත ප්‍රායෝගික පළපුරුද්ද, හැකියාව, නිපුණතාවය හා ශාරීරික යෝග්‍යතාවය පරීක්ෂා කිරීමෙන් අනතුරුව ඉන් අයදුම්කරුවන් 29 දෙදෙනෙකුට සමාලෝචිත වර්ෂය සඳහා ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය ලබා දෙන ලදී. 2022 වර්ෂය තුළදී ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය ලබා දෙන ලද සංඛ්‍යාව 72 කි. මෙය එම වර්ෂය හා සැළකීමේ දී 43 පමණ අඩු වීමකි.

එසේම ශාස්ත්‍රීය සුදුසුකම්, නියමිත ප්‍රායෝගික පළපුරුද්ද නොතිබීම හෝ නියමිත පරිදි අයදුම්පත් යොමු නොකිරීම හේතුවෙන් ඉල්ලුම්පත් 03 ක් ප්‍රතික්ෂේප කරන ලදී. එසේම තවත් අයදුම්පත් 03 ක් 2024 වර්ෂය තුළ සළකා බැලීම සඳහා යොමු කර ඇත.

ඒ අනුව 2023 දෙසැම්බර් 31 දිනට ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය ලබා ගන්නා ලද සමස්ත මිනින්දෝරු සංඛ්‍යාව 2471 කි.

2022 සහ 2023 වසර තුළදී, ඉඩම් මැනුම් සභාව විසින් ශාස්ත්‍රීය සුදුසුකම් හා, නියමිත ප්‍රායෝගික පළපුරුද්ද සපුරන ලද අයදුම්කරුවන් වෙත ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචිය ලබාදීම පිළිබඳ සංඛ්‍යාමය තොරතුරුවල ප්‍රස්තාරික නිරූපණය පහත දක්වා ඇත.




1 වැනි රූපය

8.3 වෘත්තියේ යෙදීම සඳහා වාර්ෂික බලපත්‍ර

සමාලෝචිත වර්ෂය සඳහා මැනුම් වෘත්තියේ යෙදීමේ වාර්ෂික මැනුම් බලපත්‍ර නිකුත් කිරීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගෙන් ඉල්ලුම්පත් කැඳවීම 2023 වර්ෂයේ ඔක්තෝබර් මාසයේ දී අරඹන ලදී. ඒ අනුව 2023 වර්ෂය වෙනුවෙන් වාර්ෂික මැනුම් බලපත්‍ර ලබා ගැනීම සඳහා අයදුම්පත් 913 ක් ලැබී තිබූ අතර විවිධ අඩුපාඩු හේතුවෙන් ඉන් අයදුම්පත් 10 ක් ප්‍රතික්ෂේප කරන ලදී. ඒ අනුව 2023 වර්ෂය සඳහා වාර්ෂික මැනුම් බලපත්‍ර 903 ක් නිකුත් කර ඇත.

ඉඩම් මැනුම් සභාව විසින් 2022 වර්ෂය සඳහා වාර්ෂික මැනුම් බලපත්‍ර 911 ක් නිකුත් කරන ලද අතර එය මෙම වසර හා සැලකීමෙහිදී බලපත්‍ර 8 ක අඩුවීමකි. 2023 වසරට සාපේක්ෂව මෙම අඩු වීම ප්‍රතිශතයක් ලෙස 0.89% ක් වේ.

2022 සහ 2023 වර්ෂයන් තුළදී, ඉඩම් මැනුම් සභාව විසින් මිනින්දෝරුවරුන් වෙත නිකුත් කරන ලද වාර්ෂික මැනුම් බලපත්‍ර පිළිබඳ සංඛ්‍යාමය තොරතුරුවල ප්‍රස්තාරික නිරූපණ කිරීම පහත දක්වා ඇත.



2 වැනි රූපය

2023 ජනවාරි 1 දින සිට 2023 දෙසැම්බර් 31 දින දක්වා සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික බලපත්‍ර ලබාගත් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ මුලකුරු සමඟ නම, ලියාපදිංචි අංකය හා ජාතික හැඳුනුම්පත් අංකය යන විස්තර 2023 මැයි මස 04 දින අංක 2331 දරන ගැසට් පත්‍රයන්හි පළකර ප්‍රසිද්ධියට පත් කර ඇත.

මීට අමතරව වාර්ෂික බලපත්‍ර ලබාගත් ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ ලියාපදිංචි අංකය, මුලකුරු සමඟ නම, සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය, පදිංචි දිස්ත්‍රික්කය, ලිපිනය, දුරකථන අංක, වෘත්තීයේ යෙදීමේ වාර්ෂික බලපත්‍ර අංකය හා බලපත්‍රය වලංගු කාලසීමාව ආදි විස්තර www.landsurveycouncil.org යන වෙබ් අඩවියට ඇතුළත් කර ඇත. තව ද මෙම විස්තර ත්‍රෛමාසිකව යාවත්කාලීන කර පවත්වා ගෙන යනු ඇත.

8.4 මහජනතාව වෙත තොරතුරු ලබා දීම.

ඉඩම් මැනුම් සභාව විසින් ලබාදෙන සේවාවන් පිළිබඳ මහජනතාව දැනුවත් වී ඇති නිසා වසර ගණනක් පැරණි පිඹුරු සම්බන්ධව වුවද ඒවාට සම්බන්ධ වාර්ෂික මැනුම් බලපත්‍රලාභී මිනින්දෝරුවරුන්ගේ ජීව විස්තර තොරතුරු ලබා ගැනීම සඳහා නිබඳවම ඉඩම් මැනුම් සභාව වෙත පැමිණෙන පිරිස් බොහෝය. එම තොරතුරු නිවැරදිව හා ඉක්මනින් ලබා දීම සඳහා වාර්ෂික මැනුම් බලපත්‍රලාභී සියලුම ලියාපදිංචි මිනින්දෝරුවරුන්ගේ පෞද්ගලික ලිපිනය, ලියාපදිංචි අංකය, වාර්ෂික බලපත්‍ර අංක ආදී තොරතුරු ඇතුළත් පරිගණක ගත දත්ත පද්ධතියක් මැනුම් සභාව විසින් සකස් කර පවත්වා ගෙන යාමට කටයුතු කර ඇත. හැකිතාක් දුරට මෙම දත්ත පද්ධතියට ඔවුන්ගේ දුරකථන අංකද ඇතුළත් කර ඇති නිසා අවශ්‍ය පිඹුරු වල පිටපත් ලබා ගැනීමට දුරකථන මඟින් ඔවුන් සම්බන්ධ කර ගැනීමේ පහසුකම මහජනතාවට ලැබී ඇත. එතකුදු වුව ද මේ දක්වා අප විසින් ලබා දෙන මෙම සේවාව හරහා මහජනතාවට අවශ්‍ය බලයලත් මිනින්දෝරුවරුන් විසින් පිළියෙළ කළ පැරණි පිඹුරුවල පිටපත් ලබා ගැනීමේ දී ලත් පිටුවහල ක්‍රමානුකූල නොවීම පිළිබඳ ව මැනුම් සභාව තෘප්තිමත් නොවේ. ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් විසින් පිළියෙල කරනු ලබන පිඹුරුවල පිටපත් ලබා ගැනීම හා හෝ ඊට අදාළ වෙනත් තොරතුරු ලබා ගැනීමේ පවතින දුෂ්කරතාව මහජනතාව මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් ලෙස මෙය හඳුනා ගෙන ඇති අතර ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක කළ හැකි ක්‍රමවේදයක් සැලසුම් කිරීමට සභාවේ අවධානය මේ වන විට යොමු වී ඇත.
කෙසේ වුවද සමාලෝචිත කාලසීමාව තුළ මහජනතාවගේ ඉල්ලීම් අනුව අවස්ථා 113 කදී මෙම තොරතුරු ලබා දී ඇත.

8.5 ඉඩම් මැනුම් සභාව වෙත ලද මහජන පැමිණිලි


ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් විසින් සිදු කරනු ලබන මැනුම් කටයුතු හා පිළියෙල කරනු ලබන පිඹුරු වලට සම්බන්ධව මහජනතාවගෙන් ලැබෙන පැමිණිලි විභාග කිරීම ඉඩම් මැනුම් සභාව සතු තවත් එක් ප්‍රධාන කර්තව්‍යයකි. හුදෙක්, මෙම පැමිණිලි විභාග කෙරෙනුයේ මැනුම් පනතේ 46 වැනි වගන්තිය යටතේ සලසා ඇති විධිවිධාන වලට යටත්ව වේ. පැමිණිලි විභාග කිරීම සඳහා සෑම මසකට වරක් හෝ දෙවරක් (ලැබී තිබෙන පැමිණිලි ප්‍රමාණය අනුව) ඉඩම් මැනුම් සභාව රැස්වෙන අතර එක් විමර්ශන වාරයකදී පැමිණිලි 6 ක් හෝ 7 ක් පමණ විභාග කිරීමට කටයුතු කරයි. මෙමගින්, මහජනතාවට ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් විසින් සිදු කරනු ලබන ඉඩම් මැනුම් හා හෝ ඔවුන් විසින් පිළියෙල කරනු ලබන පිඹුරු සම්බන්ධයෙන් පවතින ගැටලු බොහෝ දුරට නිරාකරණය කර ගැනීමට හැකි වන අතරම මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය විනය හා වෘත්තීය සදාචාරය වැඩි දියුණු කර ගැනීමට අවස්ථාවක්ද මින් සැලසෙනු ඇත.
කෙසේ වුවද, සමහර පැමිණිලිවල ස්වභාවය අනුව එනම්, අධිකරණ ක්‍රියාමාර්ගවලට යටත්, චෝදනා ඔප්පු කිරීමට තරම් ප්‍රමාණවත් වූ සාක්ෂි නොමැති, අධිකරණ නියෝග අනුව උසාවි කොමසාරිස්වරුන් ලෙස කරන ලද මැනුම් සහ ඉඩම් මැනුම් සභාවේ බලතල යටතේ ක්‍රියාකළ නොහැකි ගණයේ පැමිණිලි සම්බන්ධව ඉඩම් මැනුම් සභාව තීරණ ලබා නොදෙන අතර, එවැනි අවස්ථාවලදී අදාළ පැමිණිලිකරුවන්ට එම ගැටලු අධිකරණ ක්‍රියාමාර්ගයෙන් විසඳා ගැනීමට හෝ අවස්ථානුකූලව වෙනත් සුදුසු ප්‍රතිකර්ම ගැනීම සඳහා අවශ්‍ය උපදෙස් දෙනු ලැබේ.

2023 වර්ෂයට පෙර වර්ෂයන්හි ලැබී එහෙත් එම වර්ෂයන්හි විභාග කර අවසන් කිරීමට නොහැකි වූ පැමිණිලි හා සමාලෝචිත වර්ෂය තුළ ලැබුණු හා එකී වර්ෂය තුල විභාග කර අවසන් කරන ලද පැමිණිලි පිළිබඳ සංඛ්‍යා තොරතුරු පහත දැක්වේ.

2022 දෙසැම්බර් මස 31 දිනට විභාග අවසන් නොවී ඉතිරිව තිබූ සංඛ්‍යාව	= 134
2023 වසර තුළදී ලද මුළු පැමිණිලි සංඛ්‍යාව	= 80
2023 වසර තුළදී අඩුපාඩු හේතුවෙන් ප්‍රතික්ෂේප කරන ලද පැමිණිලි සංඛ්‍යාව	= 02
2023 වසර තුළදී විභාග කර අවසන් කරන ලද පැමිණිලි සංඛ්‍යාව	= 63
2023 දෙසම්බර් 31 දිනට විභාග අවසන් නොවී ඉතිරි වූ සංඛ්‍යාව	= 149

2022 වසර තුළදී ලද පැමිණිලි සංඛ්‍යාව 72 වූ අතර එයට සාපේක්ෂව 2023 වසර තුළ පැමිණිලි ලැබීමේ ප්‍රතිශතය 8.33% කින් වැඩිවී ඇති බව නිරීක්ෂණය වේ. එසේම, පැමිණිලි විභාග අවසන් කිරීම 2022 වසරේදී 41 ක් වූ අතර එයට සාපේක්ෂව 2023 වසරේ පැමිණිලි විභාග කිරීමේ ප්‍රතිශතය 53.65% පමණ වැඩිවීමක් නිරීක්ෂණය වේ.

මෙම දත්ත පහත දැක්වෙන 2 වන රූපය මගින් ප්‍රස්ථාරිකව නිරූපණය කර ඇත.



3 වැනි රූපය

8.6 ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය හා වෙනත් විෂමාචාර සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග

මැනුම් කටයුතු කිරීමේදී විෂමාචාර ක්‍රියාවන් කර ඇති බවට සභාව නිගමනය කර ඇති විටෙක එවැනි මිනින්දෝරුවරුන්ට එරෙහිව 2002 අංක 17 දරන මැනුම් පනතේ 47 වැනි වගන්තිය යටතේ සලසා ඇති විධිවිධාන අනුව සිදු කරනු ලබන විමර්ශනයකින් අනතුරුව දඩුවම් පැනවිය හැක.

2023 වසරේදී ඉඩම් මැනුම් සභාව විසින් ඉහත 08.4 වැනි ඡේදයෙහි විස්තර කර ඇති පරිදි, ලැබෙන පැමිණිලි විභාග පවත්වනු ලැබීමෙන් පසුව ගන්නා ලද තීරණ අනුව චූදිත මිනින්දෝරුවරුන් හට පරීක්ෂණ ගාස්තු අයකිරීම් සහ අවවාද කිරීම් අවස්ථා ගණනාවකදීම සිදුකර ඇත.

තවද සමාලෝචිත කාලය තුළ එනම් 2023 වර්ෂය තුළ අවස්ථාවන් හයකදී

පමණ චූදිත ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් හය දෙනෙකු හට පහත සඳහන් පරිදි බලපත්‍ර අත්හිටුවීම හා ලියාපදිංචිය අවලංගු කිරීම යන දඩුවම් දෙකම පැණවීමට කටයුතු කර ඇත.

පැමිණිලි අංකය	ලියාපදිංචි අංකය	මිනින්දෝරුවරයාගේ නම	පරීක්ෂණයේ තීරණය
ඉමැස/5/1317	20020599	බමුණුසිංහ බී.කේ.එස්	රු.10000 ක දඩයක් සමග 2023.05.25 සිට 2023.12.31 දක්වා වාර්ෂික බලපත්‍රය අත්හිටුවා ඇත.
ඉමැස/5/1271	19880804	පෙරේරා කේ.ඩී.ඩබ්.ඩී	රු.10000 ක දඩයක් නියම කර ඇත.
ඉමැස/5/1156	19970201	තිස්සවීරසිංහ ඒ.ඊ.කේ	රු.10000 ක දඩයක් සමග 2023.03.16 සිට 2026.03.15 දක්වා වාර්ෂික බලපත්‍රය අත්හිටුවා ඇත.
ඉමැස/5/1092	19991076	නජීබ් ඒ.ඕ .එම්	රු.10000 ක දඩයක් සමග 2023.03.16 සිට 2026.03.15 දක්වා වාර්ෂික බලපත්‍රය අත්හිටුවා ඇත
ඉමැස/5/1127	19971960	කරුණාරත්න එම්.එල්.ආර්.ටී	රු 5000 ක දඩයක් නියම කර ඇත.
ඉමැස/5/1105	19990299	අබේගුණවර්ධන පී.එම්	රු 10000 ක දඩයක් නියම කර ඇත
ඉමැස/5/1290 ඉමැස/5/1199	19790243	ටී.බී.එස්.සංගරන්දෙනිය	2023.12.15 සිට 2026.12.14 දක්වා ලියාපදිංචිය අත්හිටුවා ඇත.

09. අධ්‍යාපන හා පුහුණු වැඩ කටයුතු

9.1 ප්‍රථම වරට වෘත්තියේ යෙදීමේ බලපත්‍ර ලබාගන්නා මිනින්දෝරුවරුන් සඳහා වැඩමුළු

ඉඩම් මැනුම් සභාව විසින් මැනුම් වෘත්තියේ යෙදීම සඳහා ලියාපදිංචි මිනින්දෝරුවරුන් වෙත ලබා දෙන වාර්ෂික මැනුම් බලපත්‍රය යොදා ගනිමින් ඔවුන් වෘත්තීය මිනින්දෝරුවරුන් ලෙස මැනුම් වෘත්තියට පිවිසෙන මුල්ම අවස්ථාවේ දී ඒ සඳහා දිශානුගත කිරීමේ පාඨමාලා පැවැත්වීම ද ඉඩම් මැනුම් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබේ. එම පාඨමාලාවල දී සම්පත් දායකත්වය සඳහා පුළුල් ශ්‍රාස්ත්‍රීය දැනුමක් සහ විශේෂයෙන් මැනුම් ක්ෂේත්‍රයේ මනා පළපුරුද්දක් සහිත ජ්‍යෙෂ්ඨ ලියාපදිංචි මිනින්දෝරුවරුන් යොදා ගනිමින් මෙම නවක මිනින්දෝරුවන් හට අවශ්‍ය ඥානය අවබෝධය, සහ මහපෙන්වීම ලබා දෙනු ඇත.
මැනුම් වෘත්තිකයෙකු ලෙස ප්‍රථම වරට එම වෘත්තියට පිවිසීමේ දී, කිසිදු අපහසුතාවයකින් හෝ ගැටලුකාරී තත්වයකින් තොරව ආරම්භයේ සිටම මහජනයාට උසස් හා ගුණාත්මක සේවාවක් ලබා දීමට ලියාපදිංචි මිනින්දෝරුවරයා යොමු කිරීම මෙම දිශානුගත කිරීමේ පාඨමාලා පැවැත්වීමෙහි ප්‍රධානතම අරමුණවේ.
කෙසේ වුවද 2023 වර්ෂයේදී රට තුළ ආර්ථික ඇතුළු වෙනත් අර්බුදකාරී තත්වය හමුවේ ප්‍රථම වරට වාර්ෂික මැනුම් බලපත්‍රය ලබා ගන්නා ලද ලියාපදිංචි මිනින්දෝරුවරුන් හට සමාලෝචිත වර්ෂය සඳහා දිශානුගත කිරීමේ පාඨමාලාවක් පැවැත්වීමට නොහැකි විය.

9.2 අඛණ්ඩ වෘත්තීය සංවර්ධන (CDP) පාඨමාලා

විශේෂයෙන් බිම්මැනීම හා සම්බන්ධ විෂය ගත්කල, අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් අත්‍යවශ්‍ය අංගයක් වේ. වර්තමාන සාමාජීය, ආර්ථික මෙන්ම නෛතිකමය වශයෙන් මෙන්ම සහ තාක්ෂණික වශයෙන් සිදුවන වෙනස්කම් වලට අනුරූපී ලෙස උසස් හා ගුණාත්මක පිඹුරු හා සිතියම් නිෂ්පාදනය සඳහා මැනුම් වෘත්තිකයින්ට මෙවැනි වැඩසටහන් වලින් ලැබෙන දැනුම හා මාර්ගෝපදේශයන් ඉතාමත් මහෝපකාරීවේ.
මැනුම් වෘත්තියේ යෙදී සිටින සහ මැනුම් සභාවේ වාර්ෂික බලපත්‍රය ලබා ගැනීමට අපේක්ෂා කරන වෘත්තිකයන්ගේ දැනුම සහ දක්ෂතා වැඩි දියුණු කරලීම සඳහා වෘත්තීය සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඉඩම් මැනුම් සභාව සතු කාර්යක් බවට මැනුම් පනතේ 37 වැනි වගන්තිය යටතේ සඳහන්ව ඇත. එබැවින් සියලුම ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් මැනුම් වෘත්තිය හා සම්බන්ධව නූතන තාක්ෂණය හා ක්‍රමවේද පිළිබඳව වූ පුහුණු පාඨමාලා / වැඩමුළුවලට සහභාගි කරවීම සඳහා උනන්දු කරවීම ඉඩම් මැනුම් සභාව විසින් නිරතුරුවම සිදු කරනු ලබයි.

මෙහිදී, පුද්ගලික මැනුම් වෘත්තියෙහි නියැලීමට අපේක්ෂා කරන ආධුනික මැනුම් වෘත්තිකයින් (ප්‍රථම වරට වාර්ෂික මැනුම් බලපත්‍ර ලබා ගන්නා මිනින්දෝරුවරුන් සඳහා) දිශානුගත කිරීමේ වැඩසටහන් මෙන්ම පළපුරුදු මිනින්දෝරුවරුන් සඳහා දියුණු තාක්ෂණික ක්‍රම වලට අදාල වැඩසටහන් ද වෙන් වශයෙන් පවත්වනු ලැබේ. තවද, ඉඩම් මැනුම් සභාවට අමතරව, එහි නියාමනය හා අධීක්ෂණය යටතේ ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය සහ දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරුවරුන්ගේ සංගම් වැනි පිළිගත් ආයතන මගින්ද මෙම වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

විශේෂයෙන්ම බාහිර ආයතන සහ/හෝ සංවිධාන විසින් අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීමේදී, ඒ සඳහා සහභාගි කරගන්නා සම්පත්දායකයින්ගේ ශ්‍රාස්ත්‍රීය හා විශේෂඥ දැනුම මෙන්ම ඔවුන් නියෝජනය කරන ක්ෂේත්‍රයන්හි දක්වා තිබෙන නිපුණතාව කෙරෙහි ඉඩම් මැනුම් සභාව විශේෂ අවධානයකින් කටයුතු කරනු ලබයි.

එසේම සමාලෝචිත වර්ෂය සඳහා ඉඩම් මැනුම් සභාවට අමතරව ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය සහ ගම්පහ, කුරුණෑගල හා යාපනය යන දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරු සංගම් මගින් ලියාපදිංචි

මිනින්දෝරුවරුන් සහ ලියාපදිංචි බලයලත් මිනින්දෝරුවරුන් සඳහා අඛණ්ඩ වෘත්තිය සංවර්ධන පාඨමාලා පැවැත්වීම වෙනුවෙන් දක්වා ඇති උනන්දුව පිළිබඳ ඉඩම් මැනුම් සභාව අතිශයින් සතුටට පත්වන අතර එම පාඨමාලා ඉඩම් මැනුම් සභාව විසින් පිළිගැනීමට ලක්කර ඇත.

2023 වසරේදි පවත්වා ඇති අඛණ්ඩ වෘත්තිය සංවර්ධන පාඨමාලා පිළිබඳ සාරංශයක් පහත දැක්වේ


අනු අංකය	ආයතනය	වෘත්තීය සංවර්ධන පාඨමාලාව	පැවැත්වූ දිනය
1	ඉඩම් මැනුම් සභාව	GNSS Technology & SL CORS Network	2023.01.26
2	ඉඩම් මැනුම් සභාව	Professional Ethics CORS and RTK /Real Time Kinematic Surveys and getting Information From Survey	2023.01.27
3	යාපනය දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරුවරුන්ගේ සංගමය	Department Website	2023.01.29
4	ඉඩම් මැනුම් සභාව	LIS and Future Development	2023.03.31
5	නුවර දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරුවරුන්ගේ සංගමය	Modern surveying Technology	2023.04.01
6	ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය	New Trends in Land Surveying	2023.04.20
7	ඉඩම් මැනුම් සභාව	Subsequence Surveys Under New Methodology	2023.04.21
8	යාපනය දිස්ත්‍රික් බලයලත් මිනින්දෝරුවරුන්ගේ සංගමය	Bim Saviya Surveys & Subsequence Surveys	2023.06.10
9	ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය	GIS (An introduction to GIS-Concepts & Components	2023.07.29
10	ඉඩම් මැනුම් සභාව	Code of Ethics and professional Conducts For Surveyors	2023.08.10
11	ඉඩම් මැනුම් සභාව	TLDMS Subsequence Surveys in Cadastral	2023.08.17
12	ඉඩම් මැනුම් සභාව	Land Information Systems and Future developments	2023.09.08
13	ඉඩම් මැනුම් සභාව	Land Management / Administration and Survey ACT	2023.09.18
14	ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය	Condominium surveys &Legal Aspect of Condominium Plans	2023.10.1

10. මූල්‍ය කළමනාකරණය

10.1 ආදායම් සහ වියදම

2022 වර්ෂයේ දී ඉඩම් මැනුම් සභාව ඉපැයූ ආදායම රු7,478,708 ක් වන අතර 2023 වර්ෂයේ ආදායම රු.11,387,444කි. ඒ අනුව 2022 වර්ෂය හා සැසඳීමෙහිදී මෙම වර්ෂය තුළ දී සභාව ඉපැයූ ආදායම පෙර වර්ෂයට වඩා රු.3,908,736 කින් වැඩි වී ඇත.
2022 වර්ෂය සඳහා සභාව දරන ලද වියදම රු. 7,111,198.00 වන අතර 2023 වර්ෂයෙහි සභාවේ වියදම රු. 8,256,777 කි.
ඒ අනුව 2023 වසර තුළදී සභාව රු 3130667ක ශුද්ධ ලාභයක් ලබා ඇත.

2022 සහ 2023 වර්ෂයන්හි සභාවේ ආදායමෙහි හා වියදමෙහි ප්‍රස්ථාරික නිරූපණය පහත දැක්වේ.



4 වැනි රූපය

10.2 සභාවේ අරමුදල්

මැනුම් පනතේ 56 (2) වැනි වගන්තිය යටතේ ඉඩම් මැනුම් සභාවේ අරමුදල් රැස් කළ යුතු ආකාරය විස්තර කර ඇත. ඒ අනුව, ඒකාබද්ධ අරමුදලින් ලැබිය හැකි මුදල් ද, මැනුම් පනත යටතේ සභාවට දී ඇති බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමෙන් සහ ඉටු කිරීමෙන් සභාවට ලැබෙන මුදල් ද, සභාවට බැර කළ යුතු වේ. එයට අමතරව ත්‍යාග, ප්‍රධාන සහ පරිත්‍යාග වශයෙන් සභාවට ලැබෙන මුදල් ද සභාවේ අරමුදලට එකතු වේ. සභාවේ කාර්යයන් සහ බලතල ක්‍රියාත්මක කිරීමේදී වැය වන මුදල් මැනුම් පනතේ 56(3) වගන්තිය යටතේ සලසා ඇති විධිවිධාන අනුව මෙම අරමුදලින් ගෙවිය යුතු වේ.

2023 වසර සඳහා ද පෙර වර්ෂයන්හි මෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් කිසිදු ප්‍රතිපාදන මුදලක් සභාව වෙත මහා භාණ්ඩාගාරයෙන් ලැබී නැත. එබැවින් මැනුම් සභාවේ බලතල සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමේදී සහ ඉටු කිරීමේදී ඊට අදාළ සියලු ආයතනික සහ පරිපාලන වියදම් දරන ලද්දේ එමගින් රැස් කර ගන්නා අරමුදල් මගිනි. එලෙස එක් රැස් කර ගන්නා සියලු මුදල් මැනුම් සභාව විසින් කළමනාකරණය කරනු ලැබේ.
මැනුම් සභාවේ ප්‍රධාන අරමුදල් ප්‍රභවය වන්නේ මිනින්දෝරු වෘත්තිකයන්ට වාර්ෂික බලපත්‍ර නිකුත් කිරීමෙන් ලැබෙන ආදායම වේ. එයට අමතරව, ශ්‍රාස්තීය සුදුසුකම් ලත් අය සඳහා සභාවේ ලියාපදිංචිය ලබා

ගෙන පරීක්ෂණ පැවැත්වීමෙන් සහ අවස්ථානුකූලව පරීක්ෂණ ගාස්තු ලෙස වූදිත මිනින්දෝරුවරුන්ගෙන් අයකරන පරීක්ෂණ ගාස්තු ආදියෙන්ද මැනුම් සභාවට අරමුදල් එක් රැස් වේ.

2023 වසරේ දෙසැම්බර් මස 31 වන දිනට මැනුම් සභාවේ ස්ථාවර තැන්පතු ගිණුමේ තිබූ අරමුදල් ශේෂය රු.18,515,585.00ක් විය.

10.3 සභාවේ මූල්‍ය විගණන කටයුතු

10.3.1 අභ්‍යන්තර විගණන කළමනාකරණ රැස්වීම්

මැනුම් සභාව විසින් කරනු ලබන මූල්‍ය කටයුතු විගණකාධිපති විසින් වාර්ෂික විගණනයට භාජනය කරනු ලැබේ. විගණන කළමනාකරණ කමිටුවක් ද මැනුම් සභාව විසින් පත් කර ඇති අතර එහි සංයුතිය පහත සඳහන් සාමාජිකයින්ගෙන් හා සභාවේ නිළධාරීන්ගෙන් සමන්විත වේ.

i. මුදල් අමාත්‍යාංශ නියෝජිත (සභාපති)
ii. මැනුම් සභාවේ සාමාජිකයින් දෙදෙනෙකු (සාමාජික)
iii. විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයකු (නිරීක්ෂක)
iv. ඉඩම් අමාත්‍යාංශයෙහි නියෝජිතයෙකු (සාමාජික)
v. මැනුම් සභාවේ ගණකාධිකාරී
vi. මැනුම් සභාවේ ලේකම්

සාමාන්‍යයෙන් මෙම කමිටුව ත්‍රෛමාසිකව රැස් වන අතර එහිදී, සභාවේ කටයුතු විශ්ලේෂණාත්මකව විමසා බලනු ලැබීමෙන් පසු එකී කමිටු වාර්තා මැනුම් සභාවේ අවධානයට සහ අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා යොමු කෙරේ. කෙසේ වුවද 2023 වර්ෂය තුලදී අභ්‍යන්තර විගණන කළමනාකරණ රැස්වීම් හතර (4) ක් පවත්වා ඇත.

එම රැස්වීම් සඳහා සාමාජිකයින් හා සභාවේ නිළධාරී සහභාගිවීම් පහත පරිදි වේ.

අනු අංකය	නම	තනතුර	සහභාගි වූ රැස්වීම් ගණන
1	ඩී.සී.ජයදේව මිය	සභාපති	4
2	එන්.ඒ.ගුණවර්ධන මයා	සමාජික	4
3	යූ.කේ.එස්.පී.විජේසිංහ මයා	සාමාජික	1
4	කේ.ජී .එස්.ජේ.සමරනායක මිය	නිරීක්ෂක	4
5	ඒ.කේ.ඩී.අනුරුද්ධිකා මිය	සමාජික	3
6	කේ.එල්.ඒ.එන්.සඳමාලි මිය	ගණකාධිකාරී / අර්ධ කාලීන	3
7	පී.ඩී.අනුරසිරි මයා	ලේකම් / වැඩ බලන	4

2023 වසර සඳහා නිකුත් කරන ලද විගණකාධිපතිගේ විගණන වාර්තාව මෙහි අඩංගු කොට ඇත.

එච්.එම්.බී.පී.හේරත්
ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය

ඩබ්.එස්.එල්.සී. පෙරේරා
සභාපති
ඉඩම් මැනුම් සභාව

ලේකම්
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය
"මිහිකතා මැදුර"
ඉඩම් මහලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

ඉඩම් මැනුම් සභාව

11. 2023 වර්ෂය සඳහා අවසාන ගිණුම් ප්‍රකාශය (ඇමුණුම්)

සංචාරක සහ ඉඩම් අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

2023 දෙසැම්බර් 31 වන දිනට

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

රු.

	සටහන්	2,023	2022
වත්කම්			
ජංගම නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	1	76,082,395	76,096,858
		76,082,395	76,096,858
ජංගම වත්කම්			
2023.12.31 දිනට කොග	2	300,842	383,348
ආපදා ණය	3	76,547	186,539
ස්ථාවර තැන්පතු	4	18,515,585	17,940,464
ලැබිය යුතු දෑ	5	1,509,668	627,169
උත්සව අත්තිකාරම්		2,500	
පූර්ව ගෙවීම් වියදම්		24,970	
මුදල් හා මුදල් සමාන දෑ		2,029,117	879,290
රඳවාගත් බදු		79,404	
		22,538,632	20,016,809
මුළු වත්කම්		98,621,027	96,113,667
නිමිකම් සහ වගකීම්			
ප්‍රාග්ධන දායකත්වය දරනුයේ:			
මහා භාණ්ඩාගාරය		1,043,030	1,043,030
සම්මුවිත අරමුදල		85,158,406	84,833,596
අතිරික්තය/ (ඌනතාවය)		3,130,667	367,510
		88,289,073	85,201,106
මුළු නිමිකම්		89,332,103	86,244,136
ජංගම නොවන වගකීම්			
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	6	803,225	752,040
ජංගම වගකීම්			
උපචිත වියදම්	7	769,337	589,329
පූර්ව ලැබීම්- මිනින්දෝරු දිනය සඳහා රැස්කළ මුදල්			-
පූර්ව වශයෙන් ලැබූ ආදායම්	8	7,716,362	8,528,162
		8,485,699	9,117,491
මුළු වගකීම්		9,288,924	9,869,531
මුළු නිමිකම් සහ වගකීම්		98,621,027	96,113,667

ඉඩම් මැනුම් සභාව වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම සඳහා සභාවේ සාමාජිකයන් වගකියනු ලැබේ.මෙම මූල්‍ය ප්‍රකාශනයන් හි සටහන් මගින් හෙළිදරවු කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරන ප්‍රතිපත්ති භාවිතා කර ඇත.

H.M.B.P.Herath Secretary Ministry of Tourism and Land	W.S.L.C.perera Chairman Land Survey Council	K.L.A.N.Sandamali Accountant Land Survey Council

Chairman
Land Survey Council

Accountant
Land Survey Council

H.M.B.P. Herath
Secretary
Ministry of Tourism & Lands
"Mihikatha Medura"
Land Secretariat
1200/6, Rajamalwatta Road, Battaramulla.

සංචාරක සහ ඉඩම් අමාත්‍යාංශය
ඉඩම් මැනුම් සභාව
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

රු.

	සටහන්	2023	2022
ආදායම්			
බලපත්‍ර ගාස්තු		4,987,500	3,108,900
ලියාපදිංචි කිරීමේ ගාස්තු		236,000	280,000
ස්ථාවර තැන්පතු පොළිය	9	3,358,893	1,562,631
වෙනත් ආදායම්	10	579,051	829,377
වැඩමුළුවලින් ලත් ශුද්ධ ආදායම	11	2,226,000	1,697,800
මුළු ආදායම		11,387,444	7,478,708
අඩු කළා: වියදම්			
පරිපාලන හා ආයතනික			
සේවක පාරිශ්‍රමික	12	3,035,366	2,841,015
අනෙකුත් දීමනා	13	1,975,241	1,682,370
ගමන් වියදම්	14	530,588	364,654
ලිපිද්‍රව්‍ය	2	341,713	151,402
රැස්වීම් සඳහා සංග්‍රහ වියදම්		235,335	159,945
පිරියක, යන්ත්‍රෝපකරණ හා උපකරණ අලුත්වැඩියාව			8,950
පිරියක, යන්ත්‍රෝපකරණ හා උපකරණ නඩත්තුව	15	251,620	144,797
ටෙලිකොම්/ කැපැල් හා සන්නිවේදන කටයුතු		275,600	113,681
විදුලි වියදම්		134,400	74,534
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	6	51,185	53,112
ජල බිල්පත්		4,800	4,200
විගණන ගාස්තු		239,040	144,000
ක්ෂය කිරීම්	1	228,467	267,597
අනෙකුත් වියදම්	16	929,923	1,080,611
		8,233,277	7,090,868
මූල්‍ය හා වෙනත් වියදම්			
බැංකු ගාස්තු		23,500	20,330
මුළු වියදම්		8,256,777	7,111,198
අතිරික්තය/ (ඌනතාවය)		3,130,667	367,510

සංචාරක සහ ඉඩම් අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

රු.

	සටහන්	2023	2022
මෙහෙයුම් කටයුතු වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
අතිරික්තය/ (ඌනතාවය)		3,130,667	367,510
ගැලපුම් කළා			
ක්ෂය කිරීම්	1	228,467	267,597
පාරිතෝෂික ගෙවීම සඳහා ප්‍රතිපාදන	6	51,185	53,112
බොල් ණය සඳහා වෙන්කිරීම්	16	32,800	-
සමුච්චිත අරමුදල සඳහා පූර්ව වර්ෂ ගැලපුම්	17	(124,377)	(13,630)
ස්ථාවර කැන්පතු පොළිය		(3,358,893)	(1,562,631)
කාරක ප්‍රාග්ධන වෙනස් වීම් වලට පූර්වයෙන් මෙහෙයුම් ලාභය		(40,152)	(888,042)
කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීම්			
තොග (වැඩිවීම)/(අඩු වීම)	2	82,506	(69,598)
ආපදා ණය (වැඩිවීම)/(අඩු වීම)	3	109,992	239,178
උත්සව අත්තිකාරම් සහ අනෙකුත් අත්තිකාරම් (වැඩිවීම)/(අඩු වීම)		(2,500)	-
ලැබිය යුතු දෑ (වැඩිවීම)/(අඩු වීම)	5	(833,621)	(532,849)
පූර්ව කැපැල් ගාස්තු වියදම් (වැඩිවීම)/(අඩු වීම)		(24,970)	-
ගෙවිය යුතු මුදල් (වැඩිවීම)/(අඩු වීම)	7	180,008	73,095
අත්තිකාරම් (වැඩිවීම)/(අඩු වීම)			(855,765)
ආදායම්වල පූර්ව ලැබීම් (වැඩිවීම)/(අඩු වීම)	8	(811,800)	3,059,010
රඳවාගත් බදු (වැඩිවීම)/(අඩු වීම)		(79,404)	
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		(1,419,941)	1,025,029
පාරිතෝෂික ගෙවීම්		-	(114,542)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		(1,419,941)	910,487
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
ස්ථාවර කැන්පතු	4	(575,121)	(5,089,519)
ස්ථාවර වත්කම් මිලදී ගැනුම්	1	(214,004)	(634,290)
ලැබූ පොලී ආදායම	9	3,358,892	1,562,631
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රවාහය		2,569,768	(4,161,178)
මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනනය වූ මුදල් ප්‍රවාහය			
මුදල් හා මුදල් සමාන දැහි ශුද්ධ වැඩිවීම/(අඩුවීම්)		1,149,827	(3,250,691)
කාල පරිච්ඡේදය ආරම්භයේ දී මුදල් හා මුදල් සමාන දෑ		879,290	4,129,981
කාල පරිච්ඡේදය අවසානයේ දී මුදල් හා මුදල් සමාන දෑ		2,029,117	879,290

සංචාරක සහ ඉඩම් අමාත්‍යාංශය
ඉඩම් මැනුම් සභාව
2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය

රු.

විස්තරය	සටහන්	ප්‍රාග්ධන ප්‍රදාන	සමුච්චිත අතිරික්තය/(හිඟය)	එකතුව
2023 ජනවාරි මස **01** දිනට ශේෂය		**1,043,030**	**84,833,596**	**85,876,626**
රඳවාගත් ඉපැයුම් **2022**			**367,510**	**367,510**
උපචිත අරමුදල සඳහා පූර්ව වර්ෂ ගැලපුම්	**17**	-	**(42,700)**	**(42,700)**
අතිරික්තය/ (ඌනතාවය) **2023**			**3,130,667**	**3,130,667**
2023 දෙසැම්බර් **31** දිනට ශේෂය		**1,043,030**	**88,289,072**	**89,332,102**

සංචාරක සහ ඉඩම් අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2023 වර්ෂය

රු.

සටහන 1:	දේපළ, පිරියක හා උපකරණ					
අයිතමය	2023.01.01	වර්ෂය තුළ එකතු කිරීම්	අඩු කිරීම්	ක්ෂය කිරීම් %	වාර්ෂික ක්ෂය කිරීම්	2023.12.31 දිනට ශුද්ධ අගය
ස්පෘෂ්‍ය වත්කම්						
ඉඩම්	75,100,000			-	-	75,100,000
යන්ත්‍රෝපකරණ	127,703			20%	25,541	102,162
ගෘහභාණ්ඩ	181,811	214,004		10%	39,581	356,233
පරිගණක සහ උපාංග	550,268			25%	137,567	412,701
කාර්යාලීය උපකරණ	3,806			25%	951	2,854
ඉඩම් මැනුම් සභාවේ නාම පුවරු	8,280			20%	1,656	6,624
ගොඩනැගිලි හා ව්‍යුහ (වෙන් කිරීම්)	106,714			20%	21,343	85,372
අස්පෘෂ්‍ය වත්කම්					-	-
ගිණුම්කරණ මෘදුකාංග	18,277	-		10%	1,828	16,449
එකතුව	**76,096,858**	**214,004**	**-**		**228,467**	**76,082,395**

සටහන 2:	**2023.12.31** දිනට තොග		
	2023 වර්ෂයේ තොග ආරම්භක ශේෂය	**383,348**	
	වර්ෂය තුළ මිලදී ගැනීම්	259,208	
		642,555	
	2023 වර්ෂයේ ලිපිදව්‍ය වියදම්	(341,713)	
	2023 වර්ෂ අවසාන ශේෂය		**300,842**

සටහන 3:	ආපදා ණය		
ඩබ්.ඒ.එස්.ප්‍රියදර්ශනී		29,202	
ටී.ජී.ප්‍රනාන්දු		47,345	
එකතුව			**76,547**

සටහන 4:	**ස්ථාවර තැන්පතු**				
ස්ථාවර තැන්පතු අංකය	ආරම්භ කළ දිනය	කාල සීමාව	තැන්පතු වටිනාකම		
87153136	2021.02.22	වසර 1	1,000,000		
91937807	2021.11.23	වසර 1	1,315,585		
88345281	2022.01.07	වසර 1	1,000,000		
90657158	2023.04.26	වසර 1	700,000		
90731647	2023.05.12	දින 400	2,500,000		
90753437	2023.05.18	වසර 1	3,000,000		
90949435	2023.05.23	වසර 1	3,500,000		
91319643	2023.08.02	මාස 06	1,000,000		
91319580	2023.08.02	මාස 06	1,000,000		
91646794	2023.09.26	වසර 1	2,000,000		
91795666	2023.10.27	මාස 03	1,500,000		
				18,515,585	
එකතුව					**18,515,585**

සටහන 5:	**ලැබිය යුතු ආදායම**		
ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළිය		1,508,668	1,508,668
විමර්ශන සඳහා ලැබිය යුතු ගාස්තු		33,800	
බොල් ණය සඳහා වෙන්කිරීම්		(32,800)	1,000
එකතුව			**1,509,668**

සටහන 6:	**පාරිතෝෂික සඳහා වෙන් කිරීම්**			
නම	බැඳුන වර්ෂය	2022 වර්ෂය දක්වා	2023	එකතුව
ඩබ්.ඒ.එස්.ප්‍රියදර්ශනී	2004	424,980	29,880	454,860
ටී.ජී. ප්‍රනාන්දු	2004	327,060	21,305	348,365
එකතුව		**752,040**	**51,185**	**803,225**

සටහන 7:	**උපචිත වියදම්**	
උපචිත විගණන ගාස්තු	339,840	
උපචිත සන්නිවේදන සහ තැපැල් වියදම්	5,007	
උපචිත සේවක අර්ථසාධක අරමුදල්	22,293	
උපචිත සේවක භාරකාර අරමුදල්	3,344	
උපචිත සභා දීමනා	52,000	
උපචිත ගැසට් නිවේදන මුද්‍රණ ගාස්තු	27,573	
උපචිත වායුසමීකරණ ගාස්තු	60,375	
ගෙවිය යුතු මුද්දර බදු	250,500	
උපචිත සුභූරු බලපත්‍ර මුද්‍රණ ගාස්තු	8,405	
එකතුව		**769,337**

සටහන 8:	**පූර්ව ආදායම් ලැබීම්**				
ලියාපදිංචි ගාස්තු					50,000
පැමිණිලි ගාස්තු					6,000
අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් පූර්ව අත්තිකාරම්					549,550
වෙනත්					21,500
මිනුම්දෝරු දිනය					3,073,000
බලපත්‍ර ආදායම් වශයෙන් පූර්ව ලැබීම්					4,016,312
එකතුව					**7,716,362**

සංචාරක සහ ඉඩම් අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2023 වර්ෂය

රු.

සටහන 9:	ස්ථාවර තැන්පතු පොළිය				
ස්ථාවර තැන්පතු අංකය	පොළිය	ලැබිය යුතු පොළිය	ලැබිය යුතු රඳවාගැනීමේ බදු		
82652551	60450				
82652638	60450				
85143581	44358				
85143616	44358				
85143810	44358				
85144124	44358				
85144216	44358				
85144323	44358				
86795372	34382				1,929
88130317	260,687				
89850725	92,441				6,164
89850793	92,441				6,164
90008689	248,118				
90008749	248,118				
90657158		87,150			4,358
90731647		335,137			16,757
90753437		354,493			17,725
90949435		383,178			19,159
91319580		49,644			2,482
91319643		49,644			2,482
91646794		60,493			3,025
91795666		32,055			1,603
91937807		16,003			800
82652648	79,866				
82652661	79,866				
85144265	44,358				
85144298	44,358				
87153136	8,185	102,904			5,145
88345281	1,188	117,370			5,868
89850843	92,441				6,164
90812174	26,329				
90812183	26,329				
91277930	4,671				
එකතුව	1,770,821	1,588,071			99,825
		3,358,893			

සංචාරක සහ ඉඩම් අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2023 වර්ෂය

රු.

සටහන 10:	**අනෙකුත් ආදායම්**	
ප්‍රකාශන ආදායම්	23,500	
විමර්ශන ලියාපදිංචි කිරීම්වල ආදායම	74,000	
විමර්ෂනවල දඩ ආදායම	10,000	
බලපත්‍ර ගාස්තු ගෙවීම් ප්‍රමාද වීම් සඳහා ලැබූ ආදායම්	342,000	
ආපදා ණය පොළිය	5,735	
අනෙකුත් ආදායම්	52,700	
ලියාපදිංචි සහතික නැවත නිකුත් කිරීම්	1,100	
ප්‍රතික්ෂේපිත බලපත්‍ර අයදුම්පත් සඳහා සම්මුඛ පරීක්ෂණ ගාස්තු	27,000	
වැටුප් රහිත නිවාඩු	12,467	
මහජනතාව වෙත තොරතුරු නිකුත් කිරීම	30,550	
එකතුව		**579,051**

සටහන 11:	**වැඩමුළුවලින් ලැබූ ශුද්ධ ආදායම**	
අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන 16	202,500	
අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන 17	117,500	
අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන 20	330,000	
අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන 21	452,500	
අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන 25	247,500	
අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන 26	427,500	
අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන 28	242,500	
ශ්‍රී ලංකා මිනුම්දෝරුවරුන්ගේ ආයතනයෙන් ලද අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් ආදායම	150,600	
බාහිර අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහනවලින් ලද අ	55,400	
එකතුව		**2,226,000**

සටහන 12:	**පුද්ගල වේතන**	
මූලික වැටුප	1,007,670	
ජීවන වියදම් දීමනාව	187,200	
පුහුණුලාභීන්ගේ දීමනාව	1,052,000	
සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% දායකත්වය	316,907	
සේවක භාරකාර අරමුදල සඳහා 3% දායකත්වය	77,384	
දීමනාවල හිඟහිටි මුදල්	1,671	
අනෙකුත් දීමනා	392,533	
එකතුව		**3,035,366**

සටහන 13:	**අනෙකුත් දීමනා**	
සභාපති සඳහා දීමනාව	447,581	
උපසභාපති සඳහා දීමනාව	351,290	
ලේකම් සඳහා දීමනාව	159,525	
ගණකාධිකාරි සඳහා දීමනාව	142,845	
විගණන හා කළමනාකරණ කමිටු දීමනාව	78,000	
සභා දීමනාව	796,000	
එකතුව		**1,975,241**

සංචාරක සහ ඉඩම් අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2023 වර්ෂය

රු.

සටහන 14:	**ගමන් වියදම්**					
ඉඩම් මැනුම් සභාවේ රැස්වීම්					446,394	
රට අභ්‍යන්තර ගමන් වියදම්					84,194	
එකතුව						**530,588**
සටහන 15:	**පිරියත, යන්ත්‍රෝපකරණ සහ උපකරණ නඩත්තු කිරීම්**					
වායු සමීකරණ යන්ත්‍ර					60,375	
ඡායා පිටපත් යන්ත්‍රය					166,045	
Lanka Host සමාගම සඳහා					15,000	
QB Packeg සඳහා					10,200	
එකතුව						**251,620**
සටහන 16:	**අනෙකුත් වියදම්**					
ප්‍රචාරණ - ගැසට් නිවේදන					248,532	
පරිවර්තන කටයුතු					84,688	
මුද්‍රණ සහ පොත් බැඳීම් ගාස්තු					27,573	
සුභූරු බලපත්‍ර මුද්‍රණය කිරීමේ ගාස්තු					184,705	
ආපසු ගෙවීම් ගිණුම					800	
බොල් ණයකරුවන්					32,800	
අඛණ්ඩ වෘත්තීය සංවර්ධන වැඩසටහන් සඳහා වියදම්					71,440	
බදු වියදම්					116,159	
නෛතික ගාස්තු					152,500	
විවිධ වියදම්					10,725	
එකතුව						**929,923**
සටහන 17:	**සමුච්චිත අරමුදල සඳහා පූර්ව වර්ෂ ගැලපුම්**					
2023.01.01 දිනට ශේෂය					**84,833,595.79**	
මුද්දර බදු		REG/NO 19990345		500		
මුද්දර බදු		REG/NO 19861301		500		
මුද්දර බදු		REG/NO 19921667		500		
මුද්දර බදු		REG/NO 20112268		500		
බලපත්‍ර ගාස්තු ගෙවීම් ප්‍රමාද වීම් සඳහා ගාස්තු		REG/NO 20182265		5,800		
බලපත්‍ර ගාස්තු ගෙවීම් ප්‍රමාද වීම් සඳහා ගාස්තු		REG/NO 20152070		3,800		
බලපත්‍ර ගාස්තු ගෙවීම් ප්‍රමාද වීම් සඳහා ගාස්තු		REG/NO 19780511		2,500		
බලපත්‍ර ගාස්තු ගෙවීම් ප්‍රමාද වීම් සඳහා ගාස්තු		REG/NO 20122458		5,000		
බලපත්‍ර ගාස්තු ගෙවීම් ප්‍රමාද වීම් සඳහා ගාස්තු		REG/NO 20021529		3,800		
පැමිණිලි සඳහා දඩ		REG/NO 20040849		10,000		
ස්ථාවර තැන්පතු 88130317		FD 88130317		81,677		
පැමිණිලි සඳහා දඩ මුදල්		REG/NO 19971510		9,800	**124,377**	
ගැලපුම්වලින් පසු ශේෂය					**84,709,218**	

සංචාරක සහ ඉඩම් අමාත්‍යාංශය

ඉඩම් මැනුම් සභාව

මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

2023 වර්ෂය

රු.

සටහන **18:**	නීති කෘත්‍යය			
CA(WRIT)219/2019	ඩී.එම්.පී. හේමන්ති පෙරේරා		2019.07	ඉඩම් මැනුම් සභාවේ සහ සර්වේයර් ජනරාල්වරයාගේ තීරණයකට එරෙහිව
SPL 256	ප්‍රේමකුමාර රණසිංහ		2020.10.12	ඉඩම් මැනුම් සභාවේ සහ සර්වේයර් ජනරාල්වරයාගේ තීරණයකට එරෙහිව
SC/SPL/LA/466/2019	සාලිය වික්‍රමසිංහ		2020.05.27	ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුකළ අභියාචනය
SC/SPL/LA/184/2021	හාතිය උඩුමගල		2021.10.26	ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුකළ අභියාචනය
SC/SPL/LA/376/2019	අජිත් පුෂ්පකුමාර		2019.11.14	ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුකළ අභියාචනය
SC/SPL/LA/382/2019	අජිත් පුෂ්පකුමාර		2020.01.08	ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනුකළ අභියාචනය
CA/WRIT/108/2021	එන්.එච්.අලහකෝන්		2022.01.10	ඉඩම් මැනුම් සභාවේ ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලියට එරෙහිව

ඉහත නඩු කටයුතු දැනට ශ්‍රේෂ්ඨාධිකරණයේ සහ අභියාචනාධිකරණයේ විභාගවෙමින් පවතී.

12. විගණකාධිපති වාර්තාව - 2023

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. ARI/F/LSC/1/23/21

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2024 අගෝස්තු 16 දින

සභාපති

ඉඩම් මැනුම් සභාව

ඉඩම් මැනුම් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ඉඩම් මැනුම් සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ,ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වියවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 2002 අංක 17 දරන මැනුම් පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

ඉඩම් මැනුම් සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 සභාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පෙර මා ලබාගත් සභාවේ 2023 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

මෙම විගණක වාර්තාවේ දිනට පෙර මා ලබාගත් අනෙකුත් තොරතුරු මත හා මා විසින් කරන ලද කාර්යයන් මත පදනම්ව, මෙම අනෙකුත් තොරතුරු ප්‍රමාණාත්මක වශයෙන් වැරදි ලෙස දක්වා ඇති බව මම නිගමනය කරන්නේ, එම කරුණ මා විසින් වාර්තා කිරීමට අවශ්‍ය වේ. පහත විස්තර කර ඇති පරිදි, අනෙකුත් තොරතුරු වල එවැනි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් පවතින බව මම නිගමනය කරමි.

(අ) මැනුම් පනතෙහි 47 (1) (ඈ) වගන්තිය යටතේ වාර්ෂික මැනුම් බලපත්‍රය අත්හිටුවා ඇති බවට 2023 සැප්තැම්බර් 27 දින අංක 2352 දරන ගැසට් පත්‍රයේ පළ කර ඇති නාම ලේඛණයේ සඳහන් නම් 13 අතරින් එක් මිනින්දෝරුවරයෙක් පිළිබඳව පමණක් වාර්ෂික වාර්තාවේ ඇතුළත්ව තිබුණි.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	**නිරීක්ෂණ**
(අ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 9(1) වගන්තිය	තුන්වන උපලේඛනයේ සඳහන් ආයතන පමණක් බදු ගෙවීමෙන් නිදහස් කර ඇති අතර, මුදල් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂක ජනරාල්ගේ අත්සනින් එවන ලද 2023 ජූනි 17 දිනැති ලිපිය මඟින් ඒකාබද්ධ අරමුදලින් ලැබෙන ප්‍රතිපාදන හැර අනෙකුත් ආදායම්, බද්දෙන් නිදහස්කිරීමට හැකියාවක් නොමැති බව දන්වා ඇතත් 2023 දෙසැම්බර් 31 දින වන විටත් ආදායම් බදු සඳහා ලියාපදිංචි වී නොතිබුණි.
(ආ) 2016 අංක 12 දරන තොරතුරු පනතේ 25(1) වගන්තිය	තොරතුරු නිලධාරියෙකු විසින් හැකි ඉක්මනින් සහ ඉල්ලීමක් ලැබී දින දාහතරක් ඇතුළත අදාළ තීරණය, ඉල්ලීම් කළ පුරවැසියාට වහාම සන්නිවේදනය කළ යුතු බව සඳහන් වුවද 2023 වර්ෂයේ ලද තොරතුරු ඉල්ලීම් 23 කින් 09 කට පිළිතුරු ලබා දී නොමැති අතර පිළිතුරු ලබාදුන් ඉල්ලීම් 14 න් 12 ක් සඳහා දින දාහතර ඉක්මවා දින 01 සිට දින 165 ක පරාසයක කාල පමාවක් සිදු වී තිබුණි.
(ඇ) භාණ්ඩාගාර ලේකම්ගේ අංක 01/2021 හා 2021 නොවැම්බර් 16 දිනැති අංක PED/01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛයේ, රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සඳහා නිකුත්කරන ලද අත්පොතේ 6.6 ඡේදය	මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් තුළදී කෙටුම්පත් වාර්ෂික වාර්තාව සහ ගිණුම් විගණකාධිපතිට ද පිටපත්, සහිතව රේඛීය අමාත්‍යාංශයට සහ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ යුතු වුවත් සභාව 2023 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂයේ ගිණුම් විගණකාධිපතිට ඉදිරිපත් කරන ලද්දේ 2024 ජූනි 03 දිනදීය.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

	බලතල, කර්තව්‍ය, කාර්යයන්	නිරීක්ෂණ
(අ)	2002 ඔක්තෝම්බර් 04 දිනැති 2002 අංක 17 දරන මැනුම් පනත	
	(i) 32(1) වගන්තිය	සභාව විසින් පත්කරනු ලබන ලේකම්වරයෙකු සිටිය යුතු වුවත් 2002 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ලේකම්වරයෙකු පත් කර නොතිබුණි.
	(ii) 38 (උ) වගන්තිය	සභාවේ කටයුතු පරිපාලනය සම්බන්ධයෙන් රීති සකස් කර නොතිබුණි.
	(iii)46 (2) (1) වගන්තිය	සභාව වෙත ඉදිරිපත් කෙරෙන මිනින්දෝරුවරුන්ගේ වෘත්තීය විෂමාචාර පිළිබඳ පැමිණිලි විභාග කිරීම කළ යුතු වුවද 2023 වර්ෂයට පෙර ලැබී තිබුණු පැමිණිලි 134 හා 2023 වර්ෂයේදී ලැබී තිබුණු පැමිණිලි 78 ද ඇතුළුව 212 ක් වූ පැමිණිලි අතුරින් පැමිණිලි 149 ක් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් විසඳා නොතිබුණි.
	(iv)47 (1) (ආ) වගන්තිය	2023 දෙසැම්බර් 15 දිනැති 333 වෙනි රැස්වීම් වාර්තාවෙන් අංක LSC/5/1290 දරන පැමිණිල්ලට අදාළව ලියාපදිංචි අවලංගු කරන ලද අංක 19790243 දරන බලයලත් මිනින්දෝරුවරයාගේ ලියාපදිංචිය 2023 දෙසැම්බර් 15 දින සිට වර්ෂ 03 ක කාලයකට අත්හිටුවා ඇති නමුත් එම මිනින්දෝරුවරයාගේ නම ගැසට්පත්‍රයේ පළකර නොතිබුණි.
	(v) 47 (3) වගන්තිය	මිනින්දෝරුවරයකු වෘත්තීය විෂමාචාරයට වරදකරු වී ඇතිවිට, ගෙවියයුතු සියලු ගාස්තු හා වියදම් සභාවට අයවියයුතු ණයක් වශයෙන් සභාව විසින් අයකරනු ලැබියයුතු වුවද, වාර්ෂික බලපත්‍ර අත්හිටුවා ඇති මිනින්දෝරුවරුන්ගේ නම ගැසට්පත්‍රයේ පළකිරීම වෙනුවෙන් සභාව විසින් වියදම් කරන ලද මුදල අදාළ මිනින්දෝරුවරුන්ගෙන් අයකර ගැනීම කර නොතිබුණි.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

2.3 **වෙනත් කරුණු**

(අ) ලියාපදිංචි අංක - 19780876 දරන මිනින්දෝරුවරයා වෘත්තීය විෂමාචාරයක් මත 2021 ජනවාරි 01 දින සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා වාර්ෂික බලපත්‍රය තාවකාලිකව අත්හිටුවා තිබුනද, සියලුම ඉඩම් මැනුම් සම්බන්ධ කාර්යාල දැනුවත් නොකිරීම හේතුවෙන් බලපත්‍රය අත්හිටුවා ඇති කාලය තුළ ඉඩම් මැන පිඹුරුපත් 31 ක් නිකුත් කොට තිබුණි. මේ සඳහා වෙනත් කිසිම නීතිමය ක්‍රියාමාර්ගයක් නොගෙන නැවත වරක් 2023 වර්ෂය සඳහා වාර්ෂික බලපත්‍ර නිකුත්කර තිබුණි.

(ආ) ලියාපදිංචි අංකය - 20122042 දරන මිනින්දෝරුවරයා වෘත්තීය විෂමාචාරයක් මත ලියාපදිංචිය 2018 සැප්තැම්බර් මස 01 දින සිට අවලංගු කළද, 2019 සිට 2021 දක්වා වාර්ෂික බලපත්‍ර නිකුත්කොට තිබුණි.

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති